කවරෙකුට පැවරුම් ආරක්ෂා කිරීමේ වගකීම නොමැත්තේ ද ඔහුට ඊමාන් හෙවත් විශ්වාසය නැත. කවරෙකුට ගිවිසුම් ඉටු කිරීමේ වගකීම නොමැත්තේ ද ඔහුට ආගමක් නැත

අනස් ඉබ්නු මාලික් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මෙසේ පවසමින් මිස අපට දේශනා කළේ නැත. එනම්: "කවරෙකුට පැවරුම් ආරක්ෂා කිරීමේ වගකීම නොමැත්තේ ද ඔහුට ඊමාන් හෙවත් විශ්වාසය
නැත. කවරෙකුට ගිවිසුම් ඉටු කිරීමේ වගකීම නොමැත්තේ ද ඔහුට ආගමක් නැත."
[حسن لغيره] [رواه أحمد]

අනස් ඉබ්නු මාලික් (රළියල්ලාහු අන්හු) තුමා මෙසේ දන්වා සිටියි: කරුණු දෙකක් මෙනෙහි කිරීමෙන් තොරව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් උපදෙසක් හෝ දේශනාවක් කිරීම විරල විය. පළමුවැන්න: තමන් භාරයේ තබන ලද කිසිවකුගේ ධනය, ජීවිතය හා පවුල සම්බන්ධයෙන් වංචාවක් සිදු වන්නේ ද එවන් අයකුට පූර්ණ දේව විශ්වාසය නැත. දෙවැන්න: කවරෙකු ගිවිසුම්, ප්රතිඥා කඩ කරමින් ඒවායෙහි වංචනික ලෙස කටයුතු කරන්නේ ද ඔහුට පූර්ණ ආගමක් නැත.

https://sunnah.global/hadeeth/si/show/66251